උඩදුම්බර ප්‍රාදේශීය සභාව

මහනුවර දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.2,424,216ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර,රු.42,160,398 ක වටිනාකම වූ බහුකාර්ය ගොඩනැගිල්ල, ප්‍රාදේශීය සභාව සතු ඉඩම් 7 ක හා අම්බලමක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ආ) සභාව සතු අම්බලම් ලෙස රු.775,000 ක වටිනාකමක් ගිණුම්ගත කර ඇතත්, ඉන් බොහෝමයක් විනාශ වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව පැවති රු.250,000 ක් වටිනාකම වූ යන්ත්‍ර 2 ක් හා වටිනාකම හඳුනා නොගත් ඡායා පිටපත් යන්ත්‍රයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දරා තිබුණු රු.19,466 ක දුන් වට්ටම් හා රු.30,000 ක විගණන ගාස්තුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මාස 3 ක රු.1,058,700 ක මුද්දර ගාස්තුව පමණක් ගිණුම්ගත කර තිබුණු අතර, වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම හා ලැබිය යුතු මුද්දර ගාස්තුව ඇස්තමේන්තු පදනම මත හෝ ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ලැබී තිබුණු රු.3,900,000 ක ප්‍රාග්ධන ආදායම හා රු.3,396,941 ක ප්‍රාග්ධන වියදම ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.18,843,253 ක් වූ අතර,එයින් වසර 1-5ත් අතර කාලයක් ඉක්මවා තිබූ වටිනාකම රු.1,776,654 ක් හා වසර 5කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.1,575,429 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.20,070,495 ක් විය. එයින් වසර 1-5 ත් අතර කාලයක් නිරවුල් නොකල ශේෂය රු.2,064,826 ක් හා වසර 5ක කාලයක් ඉක්මවූ ශේෂය රු.94,850 ක් විය.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සක්ෂි නොවීම
-------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.10,664,417 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 18 වගන්තිය | සභාව සතු වත්කම් 99 ක් සඳහා හිමිකම් පිළිබඳ ලියවිලි ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පවරන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 1523/16 දරන 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය | බල ප්‍රදේශයේ පැවති දුම්කොළ වියළීමේ කර්මාන්ත හා වී ඇඹරුම්හල් ඇතුළුව කර්මාන්ත 21 කට අදාළ බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර, ඒ හේතුවෙන් සභාවට රු.92,400 ක ආදායමක් අහිමි වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,687,105 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,973,207 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.713,898 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.713,898 ක වර්ධනයට බදු කුලී ආදායම රු.445,505 ක, බලපත්‍ර ගාස්තු රු.259,590 ක හා වෙනත් ආදායම් රු.284,640 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර, අනුපාතය පිළිවෙලින් 1.5:1, 1.2:1 සහ 1.7:1 ක් විය.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ප්‍රාදේශීය සභාවට යන්ත්‍රෝපකරණ ඒකකයක් ස්ථාපිත කිරීමට ලබා දුන් යන්ත්‍රෝපකරණ වලින් ආදායම් වර්ධනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 2.4.2 වරිපනම්

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වූ රු.279,764 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළදී අයකර ගෙන තිබුණේ සියයට 64 ක් වැනි ප්‍රතිශතයකි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.211,993ක් වූ අතර, එම ශේෂය තුළ වසර 1-5 ත් අතර රු.12,466 ක් වූ ශේෂයක් විය.

2.4.3 වෙනත් ආදායම්
------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුලී රථ හා ත්‍රීරෝද රථ ගාස්තු
------------------------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කුලී රථ හා ත්‍රීරෝද රථ ගාස්තු ශේෂය රු.223,500 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 1-5 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.87,000 ක ශේෂයක්ද විය.

(ආ) ට්‍රැක්ටරයෙන් හා බවුසරයෙන් සේවා සැපයීම
----------------------------------------------------
සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.66,700 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයවී තිබුණේ රු.700 ක් පමණි.

(ඇ) අක්කර බදු
---------------

(i) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.200,334 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.6,678 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 3ක ප්‍රතිශතයක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසම්බර් 31 දිනට හිඟහිටි අක්කර බදු ශේෂය රු.197,257 ක් විය. එම ශේෂයට වර්ෂ 1-5 ත් අතර කාලයක් ඉක්මවූ රු.45,672 ක හා වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු.147,967 ක ශේෂ ඇතුළත් විය.

(ඇ) ජල ගාස්තු
--------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.919,103 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.511,309 ක මුදලක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 55ක අගයක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.686,843 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 1-5 ත් අතර කාලයක් ඉක්මවූ රු.404,108 ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි.

(ඉ) කඩ කුලී
-----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩ කුලී ශේෂය රු.83,430 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 5 ක් ඉක්මවූ රු.20,830 ක අයවිය යුතු ශේෂයක් පැවතුණි

2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,369,132 ක මුදලක් අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති හිඟ මුද්දර ගාස්තු ආදායම රු.1,151,890ක් වූ අතර, එම ශේෂය තුළ වසර 5 ට වැඩි රු.11,000 ක් සහ වසර 1-5 ත් අතර කාලයට අදාළ රු.619,740 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------
3.1 කාර්යසාධනය
-----------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් ඉහළ නැංවීම ප්‍රාදේශීය සභාවකින් ඉටු විය යුතු ප්‍රධාන කාර්යයක් වුවද, කාණු පද්ධති පිරිසිදු කිරීම, නගරය පිරිසිදුව තබා ගැනීම කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.24,383,416 ක පුනරාවර්තන ආදායමෙන් කිසිදු මුදලක් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොදවා නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී පුරනැගුම ව්‍යාපෘති ප්‍රතිපාදන මඟින් රු.42,160,398 ක් වැයකර ඉදිකර තිබුණු බහුකාර්යය ගොඩනැගිල්ලේ වර්ග අඩි 4870 ක ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවතුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ තනතුරු 10 ක පුරප්පාඩු 21 ක් පැවති අතර, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක ජල යෝජනා 3 ක ජල පාරිභෝගික සංඛ්‍යාව 518 ක් වූ අතර, එයින් ජල මනු සවිකර තිබුණේ 418 කට පමණි.

(ඇ) 1982 වර්ෂයේ සංවර්ධන සභාව පැවති කාලයේ බදු ගිවිසුම් අත්සන් කර තිබූ කඩ කාමර 13 ක නව තක්සේරුවට අනුව නව ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

ප්‍රාදේශීය සභාව සතු ඩ්‍රම්ප් ට්‍රක් රථය, සිංගල් වයිබ්‍රේටින් යන්ත්‍රය, බැකෝ ලෝඩරය හා ජල බවුසරය සේවයේ යොදවා ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

සභාව සතු ට්‍රැක්ටරයක් හා යතුරු පැදි දෙකක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 හඳුනාගත් අලාභ

--------------------

2015 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව අයිතම 19ක භාණ්ඩ ඒකක 43 ක ඌනතාවක් පැවති අතර, මෙම ඌනතා පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ තිස්ස අත්තනායක සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියාව සඳහා රු.1,800,000 ක ඇස්තමේන්තු සකස්කර තිබුණි. 2016 නොවැම්බර් 31 දිනට පෙර වැඩ අවසන් කළ යුතු වුවත්, 2017 මැයි 19 දිනටද වැඩ අවසන් කර නොතිබූ අතර, යථෝක්ත ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.247,720 ක ඉදිකිරීම් ද්‍රව්‍ය සම්මන්ත්‍රණ ශාලාවේ දමා තිබුණි.

3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

මධ්‍යම පළාත් පරිසර අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.3,487,828 ක ආධාර යටතේ 2010 වර්ෂයේදී ආවරණ සහිත අර්ධ ස්වායු අගල් ක්‍රමය යටතේ සකස් කළ කාණුවක් හා කසල තේරීම සඳහා අංගනයක් ඉදිකර තිබූ අතර, රු.5,069,140 ක් වටිනා යන්ත්‍ර හා උපකරණද ලැබී තිබුණි. ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් 5 දෙනෙක් හා සභාවේ ට්‍රැක්ටර් යොදාගෙන එකතු කරන දිරන කසල අගලට යොමු කර නොදිරන කසල වලින් අලෙවිකළ හැකි ද්‍රව්‍ය වෙන්කර අනෙකුත් ද්‍රව්‍ය වලකට දමා පිලිස්සීමට කටයුතු කර තිබුණි. ඉදිකර ඇති කාණුව ගැඹුරින් වැඩිවීම හා අංගනයේ වහලය පහත් නිසා කොම්පෝස්ට් ගොඩට ගැනීමට බැකෝ යන්ත්‍රයක් යෙදිය නොහැකි වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 8 ක් ගතවී ඇතත්, පොහොර නිෂ්පාදනය කර ආදායමක් ඉපයීමට නොහැකි වී තිබුණි. මෙම ස්ථානයට විදුලිය ලබා ගැනීමේ ගැටළුවක් පවතින බැවින් කසල හලන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමටද නොහැකි වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයයන් 15 ක් සඳහා සලසා දී තිබුණු රු.125,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 27 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 29 සිට සියයට 97 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 08 ක ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් අතර සියයට 8 සිට සියයට 57 අතර පරාසයක විචලනයක් පැවතුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා  වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය
-------------------------

සමාලෝචිත වර්ෂයේදී සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------

සමාලෝචිත වර්ෂය තුල එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලනය
----------------------

පහත සඳහන් පද්ධති පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ